**Sinhalese | සිංහල**

# 2026 වසර සඳහා ප්‍රාථමික පාසලට ඇතුළත් කරගැනීම



පාසල් ආරම්භ කිරීම ළමුන්ට, දෙමාපියන්ට හා රැකබලාගන්නන්ට විශේෂ අවස්ථාවක් වේ. ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලිය ඔබට හැකිතාක් පහසු කිරීම සඳහා උපකාර කිරීමට අපි කැමැත්තෙමු.

වික්ටෝරියාව තුළ, *අධ්‍යාපන සහ පුහුණු ප්‍රතිසංස්කරණ පනත 2006* යටතේ ඔබේ දරුවාට නියම කරන ලද අසල්වැසි පාසලට (ඔබේ 'ප්‍රාදේශීය පාසල') යාමට ඔවුන්ට අයිතියක් ඇත.

ඔබට ඔබේ ප්‍රාදේශීය පාසල නොවන පාසලකට අයදුම්කිරීමට ද හැකියාවක් ඇත. ස්ථානගත කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව පාසල විසින් ඔබේ අයදුම්පත සලකා බලනු ඇත. ස්ථානගත කිරීමේ ප්‍රතිපත්තිය පිළිබඳ වැඩි විස්තර සඳහා, Enrolling in school පිටුවට පිවිසෙන්න.

## පදනම් (සූදානම්) වැඩසටහන සඳහා ප්‍රාන්තය පුරා අදාළ වන නව කාලරේඛාව

ප්‍රාථමික පාසලේ පළමු වසර පදනම් වැඩසටහන හෝ සූදානම් වැඩසටහන ලෙස හැඳින්වේ. සියලුම වික්ටෝරියානු රජයේ ප්‍රාථමික පාසල්වල අනුගමනය කිරීම සඳහා පදනම් වැඩසටහනට ඇතුළත් කරගැනීමේ කාලරේඛාව අප නිකුත් කර ඇත (4 වැනි පිටුව බලන්න). 2026 පාසල් වර්ෂය සඳහා ඔබේ දරුවා පදනම් වැඩසටහනට ඇතුළත් කරගන්නේ කවදාද සහ කෙසේද යන්න වටහා ගැනීමට ඔබට උපකාරී වීම මෙම කාලරේඛාවේ අරමුණ වේ.

## මගේ දරුවා ඔවුන්ගේ ප්‍රාථමික පාසලේ පළමු වසර සඳහා ඇතුළත් කළ යුත්තේ කවදාද?

ඔබේ දරුවා පාසල ආරම්භ කරන වසරේ අප්‍රේල් 30 වන විට දරුවාගේ වයස අවුරුදු 5ක් විය යුතුය.

වයස අවුරුදු 6 සම්පූර්ණ වූ දරුවන්ට පාසල් අධ්‍යාපනය අනිවාර්ය වේ.

2026 පාසල් වර්ෂය සඳහා ඔබේ දරුවා වික්ටෝරියානු රජයේ ප්‍රාථමික පාසලකට ඇතුළත් කරගැනීම සඳහා ඇතුළත් කරගැනීමේ අයදුම්පත 2025 ජූලි 25 වන විට පාසලට ඉදිරිපත් කරන්න.

## මගේ දරුවාගේ ප්‍රාථමික පාසලේ පළමු වසර සඳහා ඔවුන් ඇතුළත් කළ යුත්තේ කෙසේද?

ඔබේ දරුවා ප්‍රාථමික පාසලේ පළමු වසරට ඇතුළත් කිරීමට මෙම පියවරයන් ගන්න:

1. Find my School website (මගේ පාසල සොයාගැනීමේ වෙබ් අඩවිය) වෙතින් ඔබේ ප්‍රාදේශීය පාසල සොයා ගන්න (පහත බලන්න).
2. පාසල් සංචාරයක් වෙන්කරවා ගැනීමට හෝ පාසල ගැන සහ ඇතුළත් කරගැනීම සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය ගැන වැඩිදුර දැන ගැනීමට රජයේ ප්‍රාථමික පාසලක් අමතන්න.
3. පදනම් (සූදානම්) වැඩසටහනට ඇතුළත් කරගැනීමේ තොරතුරු පැකේජය Enrolling in Foundation (Prep) වෙතින් බාගත කරගන්න. 2025 අප්‍රේල් 22 වැනිදා වන විට පැකේජය

ලබාගත හැකි අතර එහි අයදුම්පත් පෝරමයක් ඇතුළත් කර ඇත. සම්පූර්ණ කිරීම සඳහා පාසල විසින් ඔබට පෝරමයේ පිටපතක් ද ලබා දිය හැකිය.

4. පදනම් වැඩසටහන සඳහා බඳවා ගැනීමේ අයදුම්පතක් **2025 ජූලි 25 වැනි සිකුරාදා** වන විට ඉදිරිපත් කරන්න.
5. ඔබගේ අයදුම්පත පිළිබඳ ප්‍රතිඵලය **2025 ජූලි 28 වැනි සඳුදා සහ අගෝස්තු 8 වැනි සිකුරාදා අතර** ඔබට දැනුම් දෙනු ලැබේ. ඔබට පිරිනැමීමක් ලැබෙන්නේ නම්, ඔබ එම පිරිනැමීම **2025 අගෝස්තු 22 වැනි සිකුරාදා වන විට** පිළිගත යුතුය.
6. ඇතුළත් වීමේ තොරතුරු සහ සංක්‍රාන්ති සැසිවලට **2025 වසරේ 4 වැනි වාරය අතරතුර සහභාගී වන්න**.
7. ඔබේ දරුවා **2026 ජනවාරි 28 වැනි දින සිට** පදනම් වැඩසටහන ආරම්භ කරනු ඇත.

## මා මගේ ප්‍රාදේශීය පාසල සොයා ගන්නේ කෙසේද?

පහත දක්වා ඇති පියවරයන් අනුගමනය කරමින් Find my School වෙබ් අඩවිය වෙතින් ඔබේ ප්‍රාදේශීය පාසල සොයා ගන්න:

1. ඔබේ බ්‍රව්සරයට findmyschool.vic.gov.au ඇතුළත් කරන්න.
2. 'Enter your address to get started' (ආරම්භ කිරීමට ඔබේ ලිපිනය ඇතුළත් කරන්න) යටතේ ඔබේ ස්ථිර පදිංචි ලිපිනය ඇතුළත් කරන්න.
3. 'Enrolment year' (ඇතුළත් කරගැනීමේ වසර) යටතේ 2026 තෝරා ගන්න. **සටහන:** 2026 වසරේ පාසල් කලාප 2025 1 වැනි වාරය අවසාන භාගයේදී ලබාගත හැකිය.
4. 'School type' (පාසල් වර්ගය) යටතේ ප්‍රාථමික පාසල තෝරා ගන්න.

එවිට සිතියම මගින් ඔබේ ලිපිනය, ඔබේ ප්‍රාදේශීය පාසල සහ එහි වම් පසින් පාසලේ සම්බන්ධතා තොරතුරු පෙන්වනු ඇත. ඔබ පහළට ගොස් බැලුවහොත්, එහි ඔබගේ ලිපිනයට ආසන්නතම පාසල් පහක් පෙන්නුම් කරයි.

'Search for school' (පාසල සොයන්න) යටතේ ඔබට පාසල්වල නම අනුව ද සෙවිය හැකිය.

## අපේ ප්‍රාදේශීය පාසල නොවන රජයේ ප්‍රාථමික පාසලක් වෙත මගේ දරුවාට අයදුම් කළ හැකිද?

ඔව්, ඔබට ඔබේ ප්‍රාදේශීය පාසල හැර වෙනත් පාසල්වලට ද අයදුම් කළ හැකිය. ස්ථානගත කිරීමේ ප්‍රතිපත්තියට සහ ලබාගත හැකි ඉඩකඩට අනුකූලව පාසල ඔබේ අයදුම්පත සලකා බලනු ඇත. අයදුම්පත් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ආකාරය පිළිබඳ තොරතුරු ඔබට Enrolling in school පිටුවෙන් සොයාගත හැකිය.

## මගේ ඇතුළත් කරගැනීමේ අයදුම්පත අසාර්ථක වූ බවට මට ලිපියක් ලැබුණහොත් කුමක් සිදුවේද?

ඔබේ දරුවා වෙනත් පාසලකට ඇතුළත් කරගැනීම සඳහා අයදුම් කළ යුතුය. ඔබේ දරුවාට ඔවුන්ගේ ප්‍රාදේශීය පාසලේ ස්ථානයක් ලැබෙන බව සහතික කරනු ලැබේ. ඔබේ දරුවාගේ ප්‍රාදේශීය පාසල තීරණය කර වන්නේ දරුවාගේ ස්ථිර පදිංචි ලිපිනය මතය. ඔබේ දරුවාගේ ප්‍රාදේශීය පාසල සොයා ගැනීමට Find my School වෙත පිවිසෙන්න. ඇතුළත් කරගැනීම සඳහා ඔබේ දරුවාගේ ලිපිනය තහවුරු කර ගැනීමට Enrolling in school පිටුව ද ඔබට උපකාරී විය හැකිය.

ඔබට තීරණයට එරෙහිව අභියාචනය කිරීමට ද හැකිය. ඇතුළත් කරගැනීමේ අයදුම්පත් සම්බන්ධ ප්‍රතිඵලයක් අභියාචනා කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු Enrolling in Foundation (Prep) පිටුවේ ඇත.

## ඇතුළත් කරගැනීමේ කාල රාමු මට මඟහැරුනහොත් කුමක් සිදුවේද?

ඔබේ දරුවා 2026 පාසල් වර්ෂය සඳහා පදනම් වැඩසටහනට ඇතුළත් කර ගැනීම සඳහා 2025 වසරේ 2 වැනි වාරයේ සිට ඕනෑම අවස්ථාවකදී ඔබට අයදුම් කළ හැකිය.

2025 ජූලි 25 වැනි සිකුරාදා වන විට ඇතුළත් වීමේ අයදුම්පතක් ඉදිරිපත් කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටින අතර, ඇතුළත් වීමේ කාලරේඛාවන් මඟ හැරුණු, ස්ථිර පදිංචිය සඳහා හෝ අලුතින් වික්ටෝරියා වෙත පැමිණෙන පවුල්වලින් ලැබෙන අයදුම්පත් මෙම දිනයෙන් පසුවත් පිළිගනු ලැබේ.

2025 ජූලි 25 වැනි දිනයෙන් පසුව ඉදිරිපත් කරන ලද ඇතුළත් කරගැනීමේ අයදුම්පත් දෙපාර්තමේන්තුවේ ස්ථානගත කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව ලැබුණු ඒවා ලෙස සලකා පාසල විසින් ඒවා පිරිසකසනු ලැබේ.

## ප්‍රාථමික පාසලට ඇතුළත් කරගැනීම පිළිබඳ වැඩිදුර තොරතුරු මට සොයාගත හැක්කේ කොතැනින්ද?

පදනම් වැඩසටහනට ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ වැඩිදුර තොරතුරු ඔබට ඔබේ ප්‍රාදේශීය ප්‍රාථමික පාසලෙන් ඉල්ලා සිටිය හැකිය.

2025 වසරේ 2 වැනි වාරය ආරම්භයේදී, පදනම් වැඩසටහනට ඇතුළත් වීමේ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු පැකේජයක් ඔබට Enrolling in Foundation (Prep)පිටුවෙන් ද සොයාගත හැකිය.

ඔබට තොරතුරු පැකේජය පරිවර්තනය කරගැනීමට උදවු අවශ්‍ය නම්, කරුණාකර සහාය සඳහා ඔබේ ප්‍රාදේශීය ප්‍රාථමික පාසලට කතා කරන්න.

## උදව් ලබාගැනීම සඳහා මා සම්බන්ධ කර ගත යුත්තේ කවුරුන් ද?

ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ ඔබට ඇති ප්‍රශ්න සම්බන්ධව ඔබට අයදුම් කිරීමට අවශ්‍ය ප්‍රාථමික පාසලේ සංක්‍රාන්ති සම්බන්ධීකාරකයාට, ඇතුළත් කරගැනීමේ නිලධාරියාට හෝ විදුහල්පතිවරයාට ඔබ වෙනුවෙන් සහාය ලබාදිය හැකිය.

## ප්‍රයෝජනවත් සබැඳි

ඔබේ දරුවා ප්‍රාථමික පාසල ආරම්භ කරන විට ඔබට උපකාරී විය හැකි ප්‍රයෝජනවත් සබැඳි කිහිපයක් පහතින් සොයා ගන්න:

මගේ පාසල සොයන්න - findmyschool.vic.gov.au

පාසල් කලාප පිළිබඳ තොරතුරු - vic.gov.au/school-zones

පදනම් (සූදානම්) වැඩසටහනට ඇතුළත් කරගැනීම - vic.gov.au/enrolling-foundation-prep

පාසලට ඇතුළත් කරගැනීම -vic.gov.au/how-choose-school-and-enrol

අබඩිතතා සහ අන්තර්ගත අධ්‍යාපනය පිළිබඳව - vic.gov.au/disability-and-inclusive-education

ප්‍රාදේශීය කාර්යාල සම්බන්ධතා - vic.gov.au/office-locations-department-education

# 2025-26 සඳහා කාලරේඛාව

| 2025 වසරේ දින | ක්‍රියාකාරකම |
|---|---|
| **2 වැනි වාරය: 2025 අප්‍රේල් 22 වැනි අඟහරුවදා සිට 2025 ජූලි 4 වැනි සිකුරාදා දක්වා** | |
| **2025 වසරේ 1 වැනි සහ 2 වැනි වාර** | ප්‍රාථමික පාසල් විසින් 2026 වසර සඳහා තම දරුවා සඳහා පදනම් (සූදානම්) වැඩසටහනට ඇතුළත් කරගැනීමට අපේක්ෂා කරන පවුල් සඳහා චාරිකා, තොරතුරු සැසි සහ වෙනත් ක්‍රියාකාරකම් පවත්වයි. |
| **2025 වසරේ 2 වැනි වාරය ආරම්භ වන විට** | 2026 පාසල් වසර සඳහා පාසල් කලාප සජීවීව [findmyschool.vic.gov.au](findmyschool.vic.gov.au) වෙතින් 2026 වසර සඳහා දෙමාපියන් හා රැකබලාගන්නන් විසින් නම් කරන ලද අසල්වැසි පාසල (ප්‍රාදේශීය පාසල) සොයා ගැනීමට, ඔවුන් [findmyschool.vic.gov.au](findmyschool.vic.gov.au) වෙත පිවිසිය යුතුය.<br>දෙමාපියන් සහ රැකබලාගන්නන් සඳහා වන ඇතුළත් කරගැනීමේ තොරතුරු පැකේජය [Enrolling in Foundation (Prep)](Enrolling in Foundation (Prep)) වෙතින් බාගත කරගැනීමට හැකිය. |
| **2025 2 වැනි වාරයේ 1 වැනි සතියේ සිට** | ප්‍රාථමික පාසල් මගින් අපේක්ෂිත පවුල්වලට හා ඔවුන්ගේ ප්‍රාදේශීය ප්‍රජාවට ඇතුළත් කරගැනීමේ තොරතුරු පැකේජ බෙදා හැරිය හැකිය. |
| **2025 2 වැනි වාරයේ 1 වැනි සතියේ සිට** | **ඇතුළත් කිරීමේ අයදුම්පත් විවෘත කර ඇත** - දෙමාපියන් සහ රැකබලාගන්නන් ඔවුන් විසින් සම්පූර්ණ කරන ලද ඇතුළත් කිරීමේ අයදුම්පත මෙම දිනයේ සිට රජයේ ප්‍රාථමික පාසලකට ඉදිරිපත් කරයි. |
| **3 වැනි වාරය: 2025 ජූලි 21 වැනි සඳුදා සිට 2025 සැප්තැම්බර් 19 වැනි සිකුරාදා දක්වා** | |
| **2025 ජූලි 25 වැනිදා වන විට** | **ඇතුළත් කරගැනීමේ අයදුම්පත් භාරදිය යුත්තේ** - දෙමාපියන් සහ රැකබලාගන්නන් ඔවුන් විසින් සම්පූර්ණ කරන ලද ඇතුළත් කරගැනීමේ අයදුම්පත්‍රය මෙම දිනය වන විට රජයේ ප්‍රාථමික පාසලකට ඉදිරිපත් කරයි. |
| **2025 ජූලි 28 වැනි සඳුදා සහ 2025 අගෝස්තු 8 වැනි සිකුරාදා අතර** | දෙපාර්තමේන්තුවේ ස්ථානගත කිරීමේ ප්‍රතිපත්තියට අනුව, ප්‍රථමික පාසල් විසින් ප්‍රාථමික පාසල් පදනම් (සූදානම්) වැඩසටහනට ඇතුළත් කරගැනීමේ ප්‍රතිඵල ලිඛිතව දෙමාපියන්ට සහ රැකබලාගන්නන්ට දැනුම් දෙයි. මෙයට පිරිනැමීමේ ලිපියක්, ඇතුළත් කරගැනීම තහවුරු කරන ලිපියක්, හෝ අයදුම්පත අසාර්ථක බව දැක්වෙන ලිපියක් ඇතුළත් විය හැකිය.<br>අයදුම්පත අසාර්ථක බව දැක්වෙන ලිපියක් ලැබුන දෙමාපියන්ට හා රැකබලාගන්නන්ට ප්‍රාථමික පාසල වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කිරීම ආරම්භ කළ හැකිය. |
| **2025 අගෝස්තු 22 වැනි සිකුරාදා වන විට** | පිරිනැමීමේ ලිපියක් ලැබුන දෙමව්පියන් සහ රැකබලාගන්නන් මෙම දිනය වන විට තම දරුවාට පිරිනමන ලද ස්ථානය පිළිගන්නා බව සඳහන් කරති. |
| **2025 අගෝස්තු 22 වැනි සිකුරාදා වන විට** | දෙමාපියන්ට හා රැකබලාගන්නන්ට ප්‍රාථමික පාසලක් වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ **අවසන් දිනය**. |
| **2025 සැප්තැම්බර් 5 වැනි සිකුරාදා වන විට** | මෙම දිනය වන විට ප්‍රාථමික පාසල් විසින් සියලුම දෙමාපියන්ට සහ රැකබලාගන්නන්ට ඔවුන්ගේ අභියාචනයේ ප්‍රතිඵලය ලිඛිතව දැනුම් දෙනු ලැබේ. |
| **2025 සැප්තැම්බර් 19 වැනි සිකුරාදා වන විට** | දෙමාපියන් සහ රැකබලා ගන්නන් ප්‍රාථමික පාසල වෙත ඉදිරිපත් කළ අභියාචනය අසාර්ථක වූ විට, අදාළ ප්‍රාදේශීය අධ්‍යක්ෂ වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ **අවසන් දිනය**. |
| **4 වැනි වාරය: 2025 ඔක්තෝබර් 6 වැනි සඳුදා සිට 2025 දෙසැම්බර් 19 වැනි සිකුරාදා දක්වා** | |
| **2025 වසරේ 4 වැනි වාරය අතරතුර** | ප්‍රාථමික පාසල් විසින් සංක්‍රාන්ති සැසි පවත්වනු ලබයි. |
| **2025 ඔක්තෝබර් 31 වැනි සිකුරාදා වන විට** | මෙම දිනය වන විට ප්‍රාදේශීය අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ අභියාචනාවල ප්‍රතිඵලය කලාපයන් විසින් සියලුම දෙමාපියන්ට සහ රැකබලා ගන්නන්ට ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මෙය අදාළ වන්නේ අවසන් දිනය වන 2025 සැප්තැම්බර් 19 වැනි සිකුරාදා වන විට ලැබෙන අභියාචනා සඳහා පමණි |